# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1811/4 - 2013 මැයි මස 21 වැනි අඟහරුවාදා - 2013.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කැලණිය ප්‍රාදේශීය සභාව කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1795/30 හා 2013 ජනවාරි මස 30 වන දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඩබ්ලි කරුණාරත්න මැතිතුමාගෙන් සැදුම්ලත් ඒකපුද්ගල පරීක්ෂණ සභාවෙහි පරීක්ෂණ කාලය අප්‍රේල් 17 දින සිට ජූලි 17 දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලබන බව නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල
හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

2013 මැයි මස 09 වැනි දින,
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

06 - 37


1A - PG 001636 — 410 (2013/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මීරිගම ප්‍රාදේශීය සභාවේ සභාපති, ආනන්ද ප්‍රේමචන්ද්‍ර රණවීර කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1795/29 හා 2013 ජනවාරි මස 30 වන දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒකපුද්ගල පරීක්ෂණ සභාවෙහි පරීක්ෂණ කාලය අප්‍රේල් 17 දින සිට ජූලි 17 දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලබන බව නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල
හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

2013 මැයි මස 09 වැනි දින,
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

06 - 38

---

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් කරුණු/චෝදනා හේතු කොටගෙන මහරගම නගර සභාවේ සභික හේවා විරුදුගේ නිශාන්ත විමලචන්ද්‍ර කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර මාස 03ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒකපුද්ගල පරීක්ෂණ සභාවක් වශයෙන් විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මැතිතුමා පත් කරමි.

පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා නම්,

1. ඔබ මහරගම නගර සභාවේ සභියකවරයෙකු වශයෙන් කටයුතු කරමින්, මහරගම නගර සභාව විසින් යෝජනා සම්මුතියකින් බලය පවරා නොතිබිය දී 2011 ජූනි මස 6 දින හෝ ඊට ආසන්න දිනක දී මහරගම නගර සභාව සඳහා බෞද්ධ කොඩි මිලදී ගැනීමට වත්තල හේකිත්ත වැලිමුණ පාර, අංක 18 ලිපිනයෙහි ක්ලිෆ්ටෙක් ඉන්ඩස්ට්‍රීස් (Cliftex Industries (Private) Limited) ආයතනය වෙතින් මිල ගණන් ලබා ගැනීමට ක්‍රියා කරමින්, බස්නාහිර පළාතේ 1991 අංක 04 දරන පළාත් පාලන අයාතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)ඈ වගන්තියෙහි සඳහන් වරද සිදු කිරීම.

2. ඔබ මහරගම නගර සභාවේ සභිකවරයෙකු වශයෙන් කටයුතු කරමින් සිටිය දී 2011 ජූනි මස 06 වන දින හෝ ඊට ආසන්න දිනයක දී මහරගම නගර සභාව සඳහා රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහස් දෙසීය විස අටක (රු. 144,228) වටිනාකමක් යටතේ බෞද්ධ කොඩි මිල දී ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ලබාගත් මිල ගණන් ඉදිරිපත් කර, මිල දී ගැනීමට සැලැස්වීමෙන්, බස්නාහිර පළාතේ 1991 අංක 04 දරන පළාත් පලාන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියෙහි 2(1)අ වගන්තියෙහි සඳහන් වරද සිදු කිරීම.

තවද බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස්වරයෙකු සතු බලතල මෙම ඒක පුද්ගල පරීක්ෂණ සභාව වෙත හිමිවන අතර, ඉහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේදී අදාළ කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උපලේඛනයට ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,<br>
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්,<br>
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල<br>
හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ<br>
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,<br>
බස්නාහිර පළාත.

ශ්‍රාවස්ති මන්දිරය,<br>
කොළඹ 07,<br>
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**වාචික සාක්ෂි :**

(i) යූ. ජී. එල්. ප්‍රනාන්දු මහතා - ලේකම්, මහරගම නගර සභාව ;

(ii) ඊ. එල්. කේ. එරබද්ද මහත්මිය - හිටපු ලේකම්, මහරගම නගර සභාව ;

(iii) මිලදී ගැනීම විෂයභාර කළමනාකරණ සහකාර - මහරගම නගර සභාව ;

(iv) සභාකටයුතු විෂයභාර කළමනාකරණ සහකාර - මහරගම නගර සභාව.

**ලිඛිත සාක්ෂි :**

මහරගම නගර සභාව

(i) මහරගම නගර සභාවේ අංක PO/1/2011/ වෙසක් දරන ගොණුව ;

(ii) 2011.05.05 දිනැති මහ සභා වාර්තාව ;

(iii) 2011.08.08 දිනැති මහරගම නගර සභා මුදල් කමිටු වාර්තාව ;

(iv) 2011.08.25 දිනැති මහරගම නගර සභාවේ සභා වාර්තා ;

(v) මහරගම නගර සභාවෙහි අංක 604154 දරන භාණ්ඩ ලැබීම් පත්‍රිකාව ;

(vi) වත්තල හේකිත්ත වැලිමුණ පාර, අංක 18 ලිපිනයෙහි ක්ලිෆ්ටෙක් ඉන්ඩස්ට්‍රීස් ආයතනය විසින් 2011 ජුනි 06 වන දින ලබා දී ඇති මිල ගණන් පත්‍රිකා.

06 - 39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.